
# ඩී පී එඩියුකේෂන් කෝඩින් පාසල
# කෝඩින් වෙසක් කලාපය - 2023



## “timedLoop” ඇසුරින් ආලෝක රටාවක් හදමු




Make my own

ආරම්භ කරන්න

DP EDUCATION Coding School

LIVEWORKSHEETS

ඉහත වීඩියෝවේ දැක්වෙන ආකාරයට දැල්වෙන බල්බ් රටාවක් නිර්මාණය කරමු.

මෙහිදී යොදා ගෙන ඇත්තේ එකම image එකකි. එම image එක පස් වතාවක් යොදා ගෙන ඇත. Images වල size එක හා x, y position එක වෙනස් කර රටාවක් ලෙස images show හා hide කිරීම මෙහිදී සිදු වේ.

මුලින් ම “yellowCircle.png” image එක add කරගෙන පහත පරිදි Properties සාදා ගන්න. එකම image එක පස් වතාවක් add කරගෙන ඇත.
















- ❖ මෙහිදී images වල id වලට, imageA, imageB, imageC, imageD, හා imageE ලෙස ලබා දෙමු. මෙලස ලබා දෙන්නේ coding වලට පහසු වීම සඳහය. කුඩාම image එකට

LIVEWORKSHEETS

imageA ලෙසත්, image වල size එක වැඩි වන පිළිවලට imageB, imageC, imageD, හා imageE ලෙස id ලබා දෙන්න.

❖ මෙහිදී සිදුවන්නේ image වල size එක වැඩි වන පිළිවලට show වීමය. මෙහිදි ප්‍රමාණය වැඩිම imageE show වන අවස්ථාවේ සියළු images තිරයේ දිස් වේ. ඉන්පසු images සියල්ල hide වීම සිදු වේ. ඒ අනුව මෙහි අවස්ථා 6 ක් තිබේ.

- පලමු අවස්ථාවේ imageA පමණක් show වීම.
- දෙවන අවස්ථාවේ imageA show වී තිබෙන විට, imageB show වීම.
- තෙවන අවස්ථාවේ imageA හා imageB show වී තිබෙන විට, imageC show වීම.
- හතරවන අවස්ථාවේ imageA, imageB හා imageC show වී තිබෙන විට, imageD show වීම.
- පස්වන අවස්ථාවේ imageA, imageB, imageC හා imageD show වී තිබෙන විට, imageE show වීම.
- හයවන අවස්ථාවේ images සියල්ල ම hide වීම.

❖ මේ සඳහා "count", "result" ලෙස variable දෙකක් නිර්මාණය කර අගය බිංදුව ලෙස ලබා දෙන්න.

```
var count = 0;
var result = 0;
```

❖ ඉන්පසු "timedLoop" ඇතුළේ "count" variable එකට 1ක් එකතු කරන්න. "timedLoop" එකට 250ms ලෙස ලබා දෙන්න.

❖ එවිට සෑම තත්පර භාගයක් තුලදී "timedLoop" එක call වෙයි. ඒ නිසා count variable එකෙහි අගය සෑම තත්පර භාගයක් තුලදී එකකින් වැඩි වෙයි. (0, 1, 2, 3, …)

❖ මෙහිදි අවස්ථා 6 ක් නිසා count එක, 6 න් බෙදා ඉතිරිය result variable එකට assign කර ගන්න. ඕනෑම සංඛ්‍යාවක් 6 න් බෙදූ විට ඉතිරි වන්නේ 0, 1, 2, 3, 4, 5 යන සංඛ්‍යා අතරින් එකක් වේ.

```
result = count % 6;
```

❖ දැන් result variable එකෙහි අගය අනුව පහත පරිදි images show වීම සිදුවිය යුතුය. (සම්පූර්ණ code කොටස පහත පරිදි වේ.)

LIVEWORKSHEETS

```
var count = 0;
var result = 0;
timedLoop(250, centerLineFun);
function centerLineFun() {
  result = count % 6;
  if(result == 0){
    showElement("imageA");
  }
  else if(result == 1){
    showElement("imageB");
  }
  else if(result == 2){
    showElement("imageC");
  }
  else if(result == 3){
    showElement("imageD");
  }
  else if(result == 4){
    showElement("imageE");
  }
  else{
    hideElement("imageA");
    hideElement("imageB");
    hideElement("imageC");
    hideElement("imageD");
    hideElement("imageE");
  }
  count = count + 1;
}
```

result = 0 විට imageA show වීමටත්,

result = 1 විට imageB show වීමටත්,

result = 2 විට imageC show වීමටත්,

result = 3  විට imageD show වීමටත්,

result = 4  විට imageE show වීම සිදු විය යුතුයි.

කුඩා image එකේ සිට පිළිවලින් විශාල වන ආකාරයට images show කරන අතර, images show කරන අවස්ථාවේ කිසිදු image එකක් hide නොකරයි.

Images සියල්ල show වීමටත් ඉන්පසු නැවත කුඩා image එකේ සිට image show වී රටාව සිදු විමටත් images සියල්ල hide වී නැවත කුඩා image එකේ සිට රටාව ආරම්භ විය යුතුය. result = 5 විට එනම් else part එකේදී images සියල්ලම hide විම සිදු විය යුතු වේ.

## අභ්‍යාසය

1. තවත් screen එකක් ගෙන එයට පින්තූර එකතුවේ ඇති කැමති වර්ණයක රූපයක් ඇතුළත් කර මෙම වීඩියෝවේ දැක්වෙන රටාව ලැබෙන සේ කෝඩ්ස් සකසන්න.

එහිදී විශාල image එකේ සිට පිළිවෙලින් කුඩා වන ආකාරයට images show කරන අතර, images show කරන අවස්ථාවේ කිසිදු image එකක් hide නොකරයි

LIVEWORKSHEETS